# ටිං ටිං ලේනා



විනුකි නෙවින්සා සේනාරත්න

කතා
විනුකි නෙවින්සා සේනාරත්න

පොතේ නම
ටිං ටිං ලේනා

ISBN No: 978-624-208-339-1

# පිදුම

මහාමායා ප්‍රාථමික විද්‍යාලයේ ගුරු මණ්ඩලයටද මාගේ
පාසලේ සහෝදරියන් හටද  මාගේ ආදරණීය
දෙමාපියන්ටද
සෙනෙහසින් ආදරයෙන් පිළිගන්වමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "**හෙරණගත්කරණී**" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



''ටිං ටිං ටිං ටිං ටිං ටිං''
ලේන් පැටියාට හොඳටම බඩගිනි
වෙලා කෑ ගසමින් කෑම සොයනවා.

''ටිං ටිං ටිං''මේ සද්දෙට අපේ විනුකි
බබාටත් ඇහැරුණා එයා ඉක්මනට
ඇඳෙන් බැහැලා ජනේලේ ලඟට ගිහින්
බැලුවා.

"අනේ අර ලේන් පැටියාට හොඳටම
බඩගිනි වෙලා කෑම සොයනවා"
විනුකි බබා කිව්වා.

ඉතින් ඉක්මනින් විනුකි බබා මුණ
හෝදගෙන අළුත් ගවුමක් ඇඳගත්තා.

ඊට පස්සේ පස්සේ විනුකි බබා අම්මාව
හොයාගෙන කුස්සියට ගියා.



"අම්මේ අම්මේ ලේන් පැටියෙකුට හොඳටම බඩගිනි වෙලා කෑම ඉල්ලලා කෑ ගහනවා අම්මේ" විනුකි බබා අම්මාට කිව්වා.

"අනේ ඇත්තද පුතේ...එහෙනම් අපි ඉක්මනට බත් ටිකක් කුරුළු ලෑල්ලට දාමු" කියලා කියපු අම්මා විනුකි බබාට භාජනයකට බත් දාලා දුන්නා කුරුළු ලෑල්ලට දාන්න.



විනුකි බබා අම්මා දුන්න බත් ටික
ගෙදර ඉස්සරහා අඹ  ගහේ තියන
කුරුළු ලෑල්ලට දැම්මා.

මේක දැකපු ලේන් පැටියා ඉක්මනට
ගහෙන් ගහට පැන පැන ඇවිත් කුරුළු
ලෑල්ලේ තියෙන බත් ටික බඩ පිරෙන්න
කෑවා.



විනුකි බබා මේ දිහා ආසාවෙන් බලාගෙන හිටියා.

බඩ පිරෙන්නම  බත් කාපු ලේන් පැටියා ආපහු අඹ ගහ දිගේ උඩට ගියා.

එහෙම ගිහින් හොඳට පැහිලා තියෙන අඹ ගෙඩියක් නැට්ට තියන තැනින් හපලා බිමට දැම්මා.

හරියට විනුකි බබාට ''ස්තූතියි'' කියන්න වාගේ.





අපේ විනුකි බබා ඒ අඹ ගෙඩිය
ඇහිඳගෙන ගෙදර ගියා.

ඉතින් අපි හැමෝම විනුකි බබා වගේ
සතුන්ට ආදරේ කරමු.ඒ වගේම
සතුන්ට හිංසා කරන්නේ නැතුව
සතුන්ව බලාගමු.

එතකොට අපිටත් කවදාවත් කවුරුත්
කරදර කරන්නේ නෑ.හැමෝම අපිටත්
ආදරේ කරනවා.

නිමි.



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්